# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 52 දරන
# නැගෙනහිර ලංකාවේ
# අඩ්ඩාලච්චේනෙයිහි අරාබි විද්‍යාලය
# (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 නොවැම්බර් මස 06 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 7 රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : ශත 60 යි. නැපැල් ගාස්තුව : රු. 1.00 යි.

**1992 අංක 52 දරන නැගෙනහිර ලංකාවේ අඩ්ඩාලච්චේනෙයිහි අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 06 වන දින]

එල්. ඩී.—ඕ. 7/88

**නැගෙනහිර ලංකාවේ අඩ්ඩාලච්චේනෙයිහි අරාබි විද්‍යාලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

"නැගෙනහිර ලංකාවේ අඩ්ඩාලච්චේනෙයිහි අරාබි විද්‍යාලය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක් එහි සාමාජිකයන් විසින් එකඟ වී ඇති රීතිවලට අනුකූලව එහි පරමාර්ථ සඵලාත්මකව ඉටුකර පමුණුවා ගැනීම සහ එකී නැගෙනහිර ලංකාවේ අරාබි විද්‍යාලයට සම්බන්ධ සියලු කරුණු ඉටු කර ගෙන යාම සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ අඩ්ඩාලච්චේනෙයිහි පිහිටුවා ගෙන තිබුණු හෙයින් ද: පූර්විකාව.

එකී ආයතනය පිහිටුවීමට මුල් වූ පරමාර්ථ සහ කාරණා එකී ආයතනය විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ එකී නැගෙනහිර ලංකාවේ අරාබි විද්‍යාලය සංස්ථාගත කරන ලෙස එකී විද්‍යාලයේ කළමනාකාර මණ්ඩලය විසින් ඉල්ලුම් කර ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉෂ්ඨ කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1992 අංක 52 දරන නැගෙනහිර ලංකාවේ අඩ්ඩාලච්චේනෙයිහි අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට සහ ඉන් පසුව, (මෙහි මින් මතු "විද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) නැගෙනහිර ලංකාවේ අඩ්ඩාලච්චේනෙයිහි අරාබි විද්‍යාලයේ කටයුතු මෙතෙක් කල් කළමනාකරණය කළ සහ ඉටුකළ තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ කළමණාකාර මණ්ඩලයට මේ පනතේ විධිවිධානවලට අනුකූලව සහ මේ පනත යටතේ සාදන ලද රීතිවලට අනුකූලව මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "නැගෙනහිර ලංකාවේ අඩ්ඩාලච්චේනෙයිහි අරාබි විද්‍යාලය" යන නාමය සහ අභිධානය යටතේ සංස්ථාවක් විය යුතු අතර ඒ නාමයෙන් එය විසින් ද එයට විරුද්ධවද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ එය පාවිච්චි කිරීමේද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේද පූර්ණ බලය සහ අධිකාරය සංස්ථාවට ඇත්තේ ය. නැගෙනහිර ලංකාවේ අඩ්ඩාලච්චේනෙයිහි අරාබි විද්‍යාලය සංස්ථාගත කිරීම.

3. එසේ පිහිටුවනු ලබන සංස්ථාවේ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාවගේ ආගමික, අධ්‍යාපනික, සාමාජික, ආර්ථික සහ සංස්කෘතික දියුණුව නංවාලීම;

(ආ) අරාබි භාෂාව පිළිබඳ පරිණත දැනුමක් සහ ප්‍රවීණත්වය ගැනීමට ශිෂ්‍යයන්ට හැකිවනු පිණිස අරාබි භාෂාව, ව්‍යාකරණ, සාහිත්‍ය, ගද්‍ය, පද්‍ය සහ අනෙකුත් අනු විෂයයන් ඉගැන්වීම සඳහා ධෛර්ය දීම;

(ඇ) "ෆිකුහ්", "තෆ්සීර්" සහ "හදීත්" වලට අනු "ෂරියත්" නොහොත් ඉස්ලාමීය නීති ඉගැ නංවාලීම;

(ඈ) "තජ්වීඩ්" වලට අනුකූලව නොහොත් නිසි උච්චාර සහිතව "හිෆ්ද්ලුල් කොරාන්" ඉගැන්වීම නොමෙ ශුද්ධ වූ කොරානය කට පාඩමෙන් කියවීම නංවාලීම ඊට ධෛර්යය දීම;

(ඉ) ඉහත (ආ), (ඇ) සහ (ඈ) ඡේදවල සඳහන් විෂයයන් කිසිවක් හෝ ඒ සියල්ලම විෂයෙහි මනා දැනුමක් යන් තුළ ඇති වන පරිදි අනෙකුත් අනුයාත විෂය අරාබි භාෂාවෙන් ඉගැන්වීම සඳහා ධෛර්යය දීම:

එසේ වුවද (ආ), (ඇ) සහ (ඈ) ඡේදවල සඳහන් යන් "සුන්නත් වල් ජමාත්" වලට අනුකූලව පම සෑම විටම ඉගැන්විය යුතු සි.

(ඊ) ඉහත සඳහන් පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් මුදුන් පමුණුවා ගැනීම සඳහා ආනුෂංගික වන්නා වූ ඉවහල් වන්නාවූ ද මේ පනතට හෝ වෙනත් යම් ලි නීතියකට අනනුකූල නොවන්නා වූද අනෙකුත් සිය ක්‍රියා සහ දේවල් ඉටු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ විසා දැමීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ ලබා ගැනීමේ ද ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ හා එ කිරීමේ ද සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාව සතුකර දී ඇති හෝ සංස්ථාව විසින් ඇති කර ගෙන ඇති හෝ ථාව විසින් දරනු ලබන යම් ඉඩමක ගොඩනැගිලි කිසිවක් ඉදිකිරී සංස්ථාවේ, පරමාර්ථ ක්‍රියාවේ යෙදීමට අවශ්‍ය නිලධරයන් සේවකයන් සේවයෙහි යෙදීමේ, සේවා නියුක්ත කිරීමේ හා කිරීමේ ද, බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ කිසිවක් හෝ ඉටු කිරීමට හෝ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය හිතකර හෝ උචිත සියලු කටයුතු, කාරණා හා දේවල් කිරීමේ, කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාව සතුවේ.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ රීති මගින් විධිවිධාන සලස්වා ඇති පරිදි හා ඒවා අනුව තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන්ගෙන් සමන්විත වූ කළමනාකාර මණ්ඩලයක් විසින් එකී රීතිවලට යටත්ව පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකාර මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරමින් සිටි විද්‍යාලයේ කළමනාකාර මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රී

6. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමකදී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එවැනි රීති සාදනු ලැබීමෙන් පසු එවැනිම රැස්වීමකදී එවැනිම ආකාරයෙන් ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි විද්‍යාලයෙහි බල පැවැත් වූ රීති මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවනතාක් දුරට මේ වගන්තිය යටතේ සංස්ථාව විසින් සාදනු ලැබූ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් විය යුත්තාහ.

විද්‍යාලය විසින් ගෙවිය යුතු සහ විද්‍යාලයට අයවිය යුතු ණය.

7. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී විද්‍යාලයේ පැවැති සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර එදිනට විද්‍යාලයට අයවිය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් හා ආධාර මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නියෝදනයකින් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව වෙත පැවරෙන යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීම හා දැරීම සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාව විසින් කළ හැකි අතර ඒ සඳහා සංස්ථාවට නීතියෙන් බලය ඇත්තේ ය. තවද එවැනි සියලු දේපළ, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ තත්කාලයේ බල පවත්නා රීතිවලට යටත්ව ඒ දේපළ උකස් කිරීමේ, විකිණීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාවේ ආදායම සහ දේපළ යෙදවීම.

9. සංස්ථාවේ ආදායම සහ දේපළ හුදෙක් සංස්ථාවේ මෙහි සඳහන් කර ඇති පරමාර්ථ නංවාලීම පිණිස ම යොදා ගත යුතු අතර ඉන් කිසිම කොටසක්, සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ, ණය, ප්‍රසාද මුදල් හෝ වෙනත් ආකාරයකින් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය :

එසේ වුවද, මේ වගන්තියේ විධිවිධාන මගින්, පහත දැක්වෙන ගෙවීම් එනම්—

(අ) සංස්ථාවේ යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු හෝ සංස්ථාවේ යම් සාමාජිකයකු විසින් සංස්ථාවට කරන ලද යම් සේවාවක් වෙනුවෙන්, සද්භාවයෙන් යම් සාධාරණ සහ නිසි පාරිශ්‍රමිකයක් ඔහුට ගෙවීම;

(ආ) සංස්ථාවේ යම් සාමාජිකයකු විසින් හෝ සංස්ථාවේ සාමාජිකයකු යම් සමාගමක කොටස්කරුවකු වන අවස්ථාවක ඒ සමාගම විසින්, සංස්ථාවට කුලියට දෙන ලද ස්ථානයක් සඳහා සාධාරණ සහ නිසි කුලියක් ගෙවීම; සහ

(ඇ) තම කර්තව්‍ය හෝ කාර්ය ඉටු කිරීමෙහි ලා හෝ සංස්ථාවේ පරමාර්ථ නංවාලීමෙහි ලා, සංස්ථාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවානියුක්තයකු විසින් කළමනාකාර මණ්ඩලයෙන් කලින් ලබා ගන්නා ලද අනුමැතිය ඇතිව දරන ලද යුක්තිසහගත හා නිසි වියදම් ආපසු ගෙවීම හා පියවීම වළක්වනු නොලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

10. සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර එකී තැනැත්තන් තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

11. මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින් ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

12. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය

---

පාර්ලිමේන්තු විවාද සිංහල පිටපත් කොටස්වල සහ පිටපත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 670 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.